සැ. යු. - මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2026 වර්ෂය සඳහා ගාල්ල දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,481 - 2026 මාර්තු මස 20 සිකුරාදා - 2026.03.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු අ◌ැබැර්තු ... ... | — | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... | — | අයවැය ලේඛන ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... | 398 | දේපළ විකිණීම් ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | — | විවිධ දැන්වීම් ... ... | 400 |


සැ. යු. - (i) ජාතික ජලසම්පාදන හා ජලපවාහන මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත 2026 මාර්තු මස 13 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත 2026 මාර්තු මස 13 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(iii) මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත 2026 මාර්තු මස 13 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබැර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 අප්‍රේල් මස 10 දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 මාර්තු 27 දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2026 ජනවාරි මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පළාත් පාලන නිවේදන

**පාතහේවාහැට ප්‍රාදේශීය සභාව**

ගෝසාතකාගාර ආඥාපනත (2) වගන්තිය යටතේ විරෝධතා කැඳවීම

මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි සඳහන් ස්ථානයෙහි ගවමස් වෙළඳසැලක් පවත්වාගෙන යාම සඳහා 2026 වර්ෂයට බලපත්‍ර ලබාදෙන ලෙස ඉල්ලීමක් කර ඇති බවට ගෝසාතකාගාර ආඥාපනත 7(2) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

02 . මෙම බලපත්‍රය ලබා දීමට විරෝධතාවයක් පවතී නම් පාතහේවාහැට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචි ඕනෑම අයෙකුට විරෝධතා ඉදිරිපත් කළ හැකිය. එම විරෝධතාවලට හේතු සහිතව පිටපත් 02 කින් යුක්ත ලියවිල්ලක් මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින 14 ක් (දහහතරක්) ඇතුළත මා වෙත ඉදිරිපත් කරන ලෙසට මෙයින් දන්වා සිටිමි.

**උපලේඛනය**

| *නම හා ලිපිනය* | *වෙළඳ ස්ථානයේ ලිපිනය* | *වෙළඳාම් කරන මස් වර්ගය* |
|---|---|---|
| අබුබක්කර් අනාසුදීන්,<br>අංක 234/D,<br>නිලවල පාර, උඩුදෙණිය,<br>මාරස්සන | කොට්ටගස්මුල, මාරස්සන | ගවමස් |

කේ. එස්. බී. රාජනායක,
ගරු සභාපති,
පාතහේවාහැට ප්‍රාදේශීය සභාව.

2026 මාර්තු මස 13 දින,
පාතහේවාහැට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දීය.

03-601

---

**මහරගම නගර සභාව**

255 අධිකාරය නගර සභා ආඥාපනතේ 50 හා 52 වගන්ති ප්‍රකාරව විරෝධතා කැඳවීමයි

255 අධිකාරය නගර සභා ආඥාපනතේ 50 හා 52 වගන්ති ප්‍රකාරව බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහරගම නගර සභා සීමාවේ පිහිටි උපලේඛනයේ දක්වා ඇති මංමාවත් මහරගම නගර සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට 2019.05.10 දින යෝජනා සම්මුතියට අනුව මහ සභාව තීරණය කර ඇත.

මේ පිළිබඳව පොදු ජනතාව හෝ අදාළ දේපළ හිමියන් විසින් විරුද්ධත්වයක් දක්වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට එක් මාසයක් ඇතුලත ලිඛිතව ඉදිරිපත් කළ යුතුය.

මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් මෙම උපලේඛනයේ සඳහන් පාරවල් මහරගම නගර සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබ බවන මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

එස්. එම්. සමන් සමරකෝන්,
සභාපති,
මහරගම නගර සභාව.

2025 දෙසැම්බර් මස 22 දින,
මහරගම නගර සභාවේ දීය.

**උපලේඛනය**

| *මාර්ගයේ නම* | *ග්‍රාම සේවා වසම* | *සැලසුම් අංකය හා මිනින්දෝරුගේ නම* | *මාර්ගයේ දිග (අඩි)* | *මාර්ගයේ පළල (අඩි)* | *මාර්ගයේ ආරම්භය (වරිපනම් අංක)* | *මාර්ගයේ අවසානය (වරිපනම් අංක)* |
|---|---|---|---|---|---|---|
| මාදිවෙල තලවතුගොඩ පාර | 524 මාදිවෙල | ඩබ්ලිව්. එස්. නානායක්කාර, 832, 1994.02.04 | 205 | 12 | 400 | 400/5 |

03-615

---

**මහරගම නගර සභාව**

නගර සභා ආඥාපනත යටතේ (255 අධිකාරය) 50 හා 52 වන වගන්තිය ප්‍රකාර විරෝධතා කැඳවීමයි

නගර සභා ආඥා පනතේ 255 අධිකාරයේ 50 හා 52 වගන්ති ප්‍රකාර බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහරගම නගර සභා සීමාවේ පිහිටි උපලේඛනයේ දක්වා ඇති මංමාවත් මහරගම නගර සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට මහ සභාව තීරණය කර ඇත.

මේ පිළිබඳව පොදු ජනතාව හෝ අදාළ දේපළ හිමියන් විසින් විරුද්ධත්වයක් දක්වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට එක් මාසයක් ඇතුළත ලිඛිතව ඉදිරිපත් කළ යුතුය.

මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් මෙම උපලේඛනයේ සඳහන් පාරවල් මහරගම නගර සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

එස්. එම්. සමන් සමරකෝන්,
සභාපති,
මහරගම නගර සභාව.

2026 මාර්තු මස 05 දින,
මහරගම නගර සභාවේ දී ය.

**උපලේඛනය**

| *මාර්ගයේ නම* | *ග්‍රාම සේවා වසම* | *සැලසුම් අංකය හා මිනින්දෝරුගේ නම* | *මාර්ගයේ දිග (අඩි)* | *මාර්ගයේ පළල (අඩි)* | *මාර්ගයේ ආරම්භය (වරිපනම් අංක)* | *මාර්ගයේ අවසානය (වරිපනම් අංක)* |
|---|---|---|---|---|---|---|
| පොල්වත්ත ග්‍රාම සංවර්ධන මාවත අතුරු මාර්ගය | 529 පොල්වත්ත | 1988.01.28 423 - ලොට් B ඩබ්ලිව්. පී. ජී. ඩී. ඩී. ජයවර්ධන | අඩි 100-0 | අඩි 15 | 37 | 2/35 |

03-618

# විවිධ දැන්වීම්

## ගොඩකවෙල ප්‍රාදේශීය සභාව

## කසළ ගාස්තු අය කිරීම - 2026

ගොඩකවෙල ප්‍රාදේශීය සභාවේ සභාපති, ඩී. ඒ. ජී. කුලරත්න වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (03) උපවගන්තියෙන් ගොඩකවෙල ප්‍රාදේශීය සභවට පැවරී ඇති බලතල ප්‍රකාර 2026 පෙබරවාරි මස 05 දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 07-(අ) 11 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

### උපලේඛනය

| **I.** **ව්‍යාපාර ස්ථානවලින් රැස්වන කසළ සඳහා ගාස්තු අය කිරීම (10 Kg ට වැඩි)** | |
|---|---|
| *දෛනික කසළ ජනනය* | *මාසිකව අය කළ යුතු මුදල රු. ශත* |
| 25-50 Kg | 1,000.00 |
| 51-60 Kg | 3,500.00 |
| 61-70 Kg | 7,000.00 |
| 71-80 Kg | 10,000.00 |
| 81-90 Kg | 12,000.00 |
| 91-100 Kg | 15,000.00 |
| 101-120 Kg | 20,000.00 |
| 121 ට වැඩිවන සෑම 10 Kg ක් සඳහාම | 1,000.00 |
| **II.** **නොදිරන කසළ රැස් කිරීම වෙනුවෙන් ගාස්තු අය කිරීම** | |
| රැස් කිරීමේ ගාස්තුව (ලෝඩ් 01 ක් සඳහා) - රු. 3,500.00<br>කම්කරු කුලිය (750.00 x 2) - රු. 1,500.00<br>ප්‍රවාහන ගාස්තු (1km ක් සඳහා) - රු. 200.00 | |
| **III.** **වරිපනම් සීමාවෙන් පිටත රැස් කරන කසළ සඳහා ගාස්තු අය කිරීම** | |
| ව්‍යාපාරික ස්ථානයකින් මාසිකව රු. 1,000.00<br>නිවසකින් මාසිකව රු. 200.00 | |

ඩී. ඒ. ජී. කුලරත්න,
සභාපති,
ගොඩකවෙල ප්‍රාදේශීය සභාව.

03-208

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.